**බලපිටිය ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුනි 07 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බලපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අයවිය යුතු රු.259,184 ක අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් ගිණුම්වල අදාළ ගැලපීම් සිදුකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | වතුගෙදර ආදාහනාගාරය ඉදිකිරීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් ලැබිය යුතු රු.4,001,170 ක ණය මුදල ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ලෙස සලකා ගිණුම් තබා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | වතුගෙදර ආදාහනාගාරය ඉදිකිරීමේ දී ණයහිමියන් රු.571,152 ක් වැඩියෙන් ප්‍රතිපාදනය කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත සඳහා වූ රඳවුම් රු.509,401 ක් දෙවරක් ගිණුම් ගතකර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | පෙර වර්ෂ හා 2018 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලද මුද්දර ගාස්තු රු.5,000,000 ක් ණයගැතියන්ට බැර නොකර පොදු තැන්පත් ලෙස ගිණුම් ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) **නොසැසඳූ පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 13 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.13,114,886 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) **විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.168,614,377 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 218 | - | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 16,815,575 | වර්ෂ 02 ක කාලය ඉක්මවන ලද තැන්පතු ශේෂ පිළිබඳ විස්තරයක් නොතිබුණ අතර, කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.45,365,855 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.41,924,230 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 8,130,000 | 6,988,267 | 5,003,370 | 15,106,612 | 5,830,000 | 6,685,001 | 4,814,060 | 13,121,714 |
| කුලී | 2,650,000 | 144,700 | 963,025 | 369,164 | 2,600,000 | 128,550 | 96,550 | 1,187,489 |
| බලපත්‍ර ගාස්තු | 5,581,000 | 5,530,761 | 5,540,011 | 181,030 | 3,505,000 | 4,691,833 | 4,685,583 | 190,280 |
| වෙනත් ආදායම් | 117,455,000 | 56,565,652 | 31,528,075 | 140,400,603 | 105,350,000 | 103,132,284 | 103,132,284 | 115,363,027 |
| | 133,816,000 | 69,229,380 | 43,034,481 | 156,057,409 | 117,285,000 | 114,637,668 | 112,728,477 | 129,862,510 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.199,091,890 ක් වූ අතර, වර්ෂය තුළ රැස්කිරීම් රු.43,034,481 ක් වීමෙන් ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 22 ක් විය. | හිඟ ආදයම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී අයවැය ප්‍රකාරව ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ------------------- |
| සමාලෝචිත වර්ෂය තුළ අයවිය යුතු වරිපනම් හා බදු ආදායම රු.20,109,981 ක් වූ අතර, අය කිරීම් රු.5,003,070 ක් වීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.15,106,612 ක හිඟයක් විය. ඒ අනුව හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.4 කුලී ආදායම

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ------------------- |
| 2018 නොවැම්බර් 21 දින සභා තීරණය මත රු.875,973 ක කුලී ආදායම් කපා හැරීමට ලබාගත් විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ආදායම් කපා හැරීමට විධිමත් අනුමැතියක් ලබාගත යුතු වේ. | ආදායම් කපා හැරීමට අදාළ සභා තීරණය ඉදිරිපත් කරමි. ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ------------------- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.137,672,894 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.2,723,960 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ප්‍රධාන ලේකම් වෙත හිඟ මුදල් ලබා ගැනීමට ලිපි යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

**----------------------------**

### 3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 අප්‍රේල් 20 වන දිනැති අංක 2015/53 දරන ගැසට් නිවේදනය සමඟ ඉදිරිපත් කරන ලද මාර්ගෝපදේශය ප්‍රකාරව කසළ කළමනාකරණය සඳහා දිගුකාලීන වැඩපිළිවෙලක් සභාව සතුව නොවුණි. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් අවශ්‍ය වේ. | රජයේ ඉඩමක් ලබා ගැනීම සඳහා කටයුතු කරන අතර, දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කරමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතු වේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අනවසරයෙන් ඉදිකර තිබූ මහල් 03 කින් යුක්ත ගොඩනැගිල්ල පිළිබඳව පළාත් පාලන කොමසාරිස්ගේ 2017 පෙබරවාරි 15 දිනැති අංක දපපා/වි/03/01/පොදු ලිපිය මඟින් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නා ලෙසට සභාවට දැනුම් දී තිබූ | අනවසර ඉදිකිරීම් සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කළ යුතු | සභා නීතිඥවරයාට අනවසර ඉදිකිරීම සම්බන්ධව කටයුතු කිරීමට ලිපිගොනුව භාර දී ඇත. |

අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 52 වෙ. වගන්තිය ප්‍රකාරව අවශ්‍ය කටයුතු සභාව විසින් සිදුකර නොතිබුණි.

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරු 11 ක පැවති සේවක පුරප්පාඩු සඳහා විධිමත්ව බඳවා ගැනීමට ද අතිරික්ත තනතුරු 08 ක් විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළ කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු විධිමත්ව බඳවා ගැනීමටත්, අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | ප්‍රජා සංවර්ධන නිලධාරි තනතුර පළාත් පාලන දෙපාර්තමේන්තුව ලබා දී ඇති තනතුරකි. ඉතිරි තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව බඳවා ගන්නා ලද සේවකයින් 06 දෙනෙකුගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා සභා අරමුදලින් රු.2,077,982 ක වියදම් දරා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මු.රෙ. 71 යටතේ ඉදිරියේ දී විධිමත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 08 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.242,480 ක් විය. | හිඟ ණය ශේෂ අයකර ගත යුතු වේ. | හිඟ ණය ශේෂ ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අක්කර 02 යි රූඩ් 01 පර්චස් 4.5 ක් වපසරියක් සහිත වතුගෙදර තොටවත්ත ආදාහනාගාරය හා සුසාන භූමිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට අයත් ඉඩම්වල ආරක්ෂාව තහවුරු කරගත යුතු වේ. | ඉදිරියේ දී සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ඉහත වතුගෙදර තොටවත්ත ආදාහනාගාරය පිහිටි ඉඩමෙහි කොටසක පවුල් 06 ක් අනවසරයෙන් නිවාස සාදාගෙන පදිංචි වී, එම නිවාස වලට ජලය හා විදුලිය පහසුකම් ද ලබාගෙන තිබූ නමුත්, සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර, සභාවට අයත් ඉඩම්වල ආරක්ෂාව තහවුරු කරගත යුතු වේ. | ඉඩම් අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කල පරිදි මෙකී පුද්ගලයන් හට විකල්ප ඉඩම් ලබා දීමට කටයුතු කරමි. |

**3.4.2 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1995 ජුලි 24 දින හමුදා භාරයට ගෙන 2007 ජුනි මස සභාවට භාර දී තිබූ ඩබල් කැබ් රථය භාවිතයට ගත නොහැකි බැවින් ලියාපදිංචිය අවලංගු කර යකඩ සඳහා විකිණීමට නිර්දේශ කර තිබුණ ද, එම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. | නිෂ්ක්‍රීය වාහනය අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම කැබ් රථය ප්‍රධාන ලේකම් හරහා සභාවට ලබා දී ඇති අතර, ඔහු සමඟ සාකච්ඡා කර ඉවත් කිරීමට ඉදිරියේ දී කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයක රු.785,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | තාත්ත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් ඉලක්ක වියදම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | වියදම් විෂයයන් 06 ක එකතුව රු.45,257,596 ක් වූ ඉතිරිවීම් තිබූ අතර, එම අගයයන් සියයට 27 සිට සියයට 83 අතර පරාසයක පැවතුණි. | තාත්ත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් ඉලක්ක වියදම් ළඟාකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | ආදායම් විෂයයන් 05 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.56,320,627 ක් වූ අතර, එම අගයයන් සියයට 22 සිට සියයට 73 අතර පරාසයක විය. | තාත්ත්වික ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. | ඉදිරි වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් ඉලක්ක ආදායම් ළඟාකර ගැනීමට කටයුතු කරමි |

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ච.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |